# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1566/1 - 2008 සැප්තැම්බර් 08 වැනි සඳුදා - 2008.09.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක 24

### 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

12 (1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 (1) වැනි වගන්තිය යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2008 ජනවාරි මස 25 වැනි දින හා අංක 1533/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විධාන අංක 22 මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමී මර්සූක්,
සභාපති.

2008 සැප්තැම්බර් මස මස 08 වැනි දින,
කොළඹ දී ය.

09-847/1

---

විධාන අංක 25

### 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

12 (1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් පහත සඳහන් කරනු ලබන දේශීයව නිෂ්පාදනය කරන පී.වී. සී. පයිප්ප සහ උපාංග කිසිම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී පයිප්ප සහ උපාංග නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා

1A - G 010179 — 580 (2008/09)

ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට සහ පහත සඳහන් කරනු ලබන ආනයනික පී.වී.සී. පයිප්ප සහ උපාංග වර්ග ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 1987 අංක 28 හා 1985 අංක 48 දරන පනත් වලින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වගන්තිය යටතේ ප්‍රකාශිත 2006 ආනයන (ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන) රෙගුලාසි යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ පරීක්ෂා කර විකිණීම සඳහා අනුමත කර ඇත්නම් මිස කිසිම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු, ආනයනකරුවෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් එකී පයිප්ප සහ උපාංග ආනයනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(i) පානීය සිසිල් ජල සැපයුම් සඳහා වූ සුවිකාර්යය නොවන පොලිවයිනයිල් ක්ලෝරයිඩ් නල - SLS 147

(ii) පානීය සිසිල් ජල සැපයුම් සඳහා වූ සුවිකාර්යය නොවන පොලිවයිනයිල් ක්ලෝරයිඩ් නල සන්ධීන් සහ උපාංග- SLS 659

මෙම විධානය වර්ෂ 2009 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2008 සැප්තැම්බර් මස, 08 වැනි දින,
කොළඹ දී ය.

09 - 847/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.